# වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ බදු නිලධාරි II පන්තිය II වන ශ්‍රේණියේ පුරප්පාඩු **04 ක්** සඳහා බඳවා ගැනීමට වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා උසස් කිරීමේ පටිපාටිය ප්‍රකාරව මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන් ම මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2024 අගෝස්තු මස කුරුණෑගල නගරයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

1. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MN 5 - 2016 අනුව.

රු. 34,605 -10 X 660 -11 X 755 -15 X 930 - රු. 63,460 වේ.